# ඒකාබද්ධ පලිබෝධ පාලනය.....

දහස් ගණනක් වසර ගොවිතැන් හුරුය පෙරසිට අපේ ගොවිනට
රහස් ගුරුකම් කෙම් නොයෙක් දෑ කළෝ ගොවිතැන හොඳින් රැකුමට
එහෙත් අද කෝ එවන් පිළියම් ඔවුන් සමගම ගොසිනි පස යට
මහත් බියකරු විපත් ගෙනදෙන 'අලුත් ක්‍රම' වීත් අණෙන් එතැනට

දෙරණ මත සමතුලිත භාවය අසම බර කළ ලෙසකි මිනිසා
උරණ වී ඉන් සොබාදම් කත වියරු සාපෙක යෙදුන විලසා
කරන වියදම් වගා රැකුමට බොහෝවෙයි පරිසරය කෙලෙසා
'සරණ කෘමි නාශකම පමණයි' සිතනවුන් වැඩි බවෙකි මෙලෙසා

නියම කාලෙදි පොළොව සකසා කෙළොත් ගොවිතැන ජය ලැබෙන්නේ
එකම යායක එකට පිදෙන ගොයම කරදර අඩු කරන්නේ
කුඹුර වටපිට වනත් හෙළිකර වදුල අඩුකර තබා ගන්නේ
ගැඹුර අඩු පරතරය නිසි සිටවුමෙනි අස්වනු වැඩි කරන්නේ

ගොඩමඩ දෙකෙහිම සරුවට වැඩෙනා ගොයමට ජල නොබඳිනු නිතිනා
ඉඩකඩ සැලසී ඉන් කෘමි හා කව රෝගද වැඩි කරවයි නිතිනා
කඩකඩ තීරු ලෙසින් සිටවූ විට සැලසෙන වාසි ගොඩයි ඉතිනා
හැඩ වැඩ වාගෙම් ගොයමට බැහැලා කරන වැඩත් කළ හැක සොඳිනා

පැලත'ර සිටිනා හැම කෘමි සතෙකුම සතුරෙකු නොවනා බව දැනයුත්තේ
හිතකරවුන් සතුරන් මඩනාවිට ගොයමට හානි එයින් අඩු තත්තේ
සුමිතුර මේ ටික දැනගෙන නොකෙළොත් හිතකරවුන් නැතිවන එක සත්තේ
නිරතුරු විමසා නිළදරුවනගෙන් ඇවැසි වුණොත් 'මැසිතෙල්' ඉස යුත්තේ

**බී. ජේ. වික්‍රමසිංහ**
හිඟුරක්ගොඩ කලාප I පැළෑටි සංරක්ෂණ විෂය භාර නිලධාරි